# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය. | நிதி, அமைச்சு | Ministry of Finance
මහලේකම් කාර්යාලය, කොළඹ-01 | செயலகம்,கொழும்பு 01 | The Secretariat, Colombo 01


---

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DMA /SYS.AUD/Checklist | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2020.10. 13 |

සියළුම ප්‍රධාන අභ්‍යන්තර විගණක වරුන්

අභ්‍යන්තර විගණක වරුන් වෙත

<u>අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්ෂම කිරීම</u>

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා විශේෂ වියදම් ඒකක සඳහා වාර්ෂික අයවැයෙන් වෙන් කෙරෙන ප්‍රතිපාදන වලින් ප්‍රමාණාත්මක අගයක් ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් වැය කෙරෙන බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය මගපෙන්වීමක් ලෙස, **ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ විගණනයේදී අදාල කරගත හැකි පිරික්සුම් ලැයිස්තුවක්** මේ සමග ඉදිරිපත් කෙරේ.

02. ඔබගේ ආයතනයේ සිදුකරනු ලබන ප්‍රසම්පාදන කටයුතු වල විනිවිදභාවය හා විධිමත්භාවය පවත්වාගෙනයාම සඳහා මෙය අදාල කර ගත යුතු අතර මේ තුළින් ප්‍රසම්පාදන කටයුතු වලට බාධා වීමක් හෝ ප්‍රමාද වීමක් සිදු නොවිය යුතු බවද අවධාරණය කෙරේ.

03. මෙම පිරික්සුම් ලැයිස්තුව මගින් ආවරනය නොවන වෙනත් කරුණු ඔබ විසින් හඳුනාගනු ලැබුවේනම් එම කරුණු මෙම ලැයිස්තුවට ඇතුලත් කිරීම සඳහා අපව දැනුවත් කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

එස්. ඒ. චන්ද්‍රිකා කුලතිලක

අධ්‍යක්ෂ ජනරාල්

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව


කාර්යාලය 2484816
அலுவலகம் 2484500
Office 2484600
2484700

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம் (9411) 2484543
Director General

ෆැක්ස්
பெக்ஸ் 2449496
Fax

වෙබ් අඩවිය
வெப் சைட் www.treasury.gov.lk
website

ඇමුණුම 1

**ප්‍රසම්පාදන විගණන පිරික්සුම් ලැයිස්තුව – භාණ්ඩ හා උපදේශක නොවන සේවා සඳහා අදියර එකේ ද්විත්ව කවර ක්‍රමය**

ප්‍රසම්පාදන අස්ථිතිය : .......................................................................................................

ප්‍රසම්පාදනයේ නම : .......................................................................................................

ප්‍රසම්පාදනයේ අංකය : .......................................................................................................

| අනු අංකය | විස්තරය | ප්‍ර.මා.සං. යොමුව | √/× / NA | විශේෂ කරුණු |
|---|---|---|---|---|
| 1 | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ අන්තර්ගත ප්‍රසම්පාදනයක් බව | 4.2 | | |
| 2 | ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන පවතින බව | 2.5.1. (අ) | | |
| 3 | සැලසුම්කළ පරිදි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කාලසටහන සමාලෝචනය කිරීම හා ඊට එකග වීම | 2.5.1. (ආ) | | |
| 4 | ප්‍රසම්පාදනයේ වටිනාකම අනුව නියමිත සංයුතියෙන් යුත් ප්‍රසම්පාදන කමිටුව පත්කර ඇති බව | 2.7 , 2.14.1 | | |
| 5 | ප්‍රසම්පාදන කමිටුව පත්කිරීම සඳහා ප්‍රසම්පාදන අත්පොතේ යෝජිත ආකෘතිය භාවිතා කර ඇති බව | 2.7.1, 2.7.4, 2.7.5, 2.7.7 | | |
| 6 | තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ඇති බව හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සංයුතිය නිවැරදි බව | 2.7.4 2.8.2 , 2.8.3. , 2.8.4 | | |
| 7 | තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම සඳහා ප්‍රසම්පාදන අත්පොතේ යෝජිත ආකෘතිය භාවිතා කර ඇති බව | 2.7.4 | | |
| 8 | ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සියළුදෙනාම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 හි දැක්වෙන ප්‍රකාශය සිදුකර ඇති බව | 2.12 | | |
| 9 | ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සියළුදෙනාම සමගින් ඒකාබද්ධ රැස්වීම පවත්වා ඇති බව | 2.11.1 (ඇ) | | |
| 10 | අදාල වන සම්මත ලංසු ලියවිලි තෝරාගෙන ඇති බව | 5.3 | | |
| 11 | ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා සියළුම සාමාජිකයින් විසින් අත්සන් කර ඇති බව | 2.11.3(අ) | | |
| 12 | ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනය නිසි පරිදි පවත්වාගෙන ගොස් ඇති බව | 2.11.2. | | |
| 13 | තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනය නිසි පරිදි පවත්වාගෙන ගොස් ඇති බව | 2.11.2 | | |
| 14 | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ලියවිලි අනුමත කර ඇති බව | 2.6.1.(අ) (iv) | | |
| 15 | ලංසු ඇගයීමේදී, ලකුණු ලබාදෙන ක්‍රමවේදය හා සුදුසුකම් ලැබීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය ලංසු ලියවිලි වල ප්‍රසිද්ධ කර ඇති බව | 3.11 | | |

| | | | | |
|---|---|---|---|---|
| 16 | ලංසු ඇගයීමේදී ලංසු මිල ප්‍රධාන සාධකයක් වන විට තෝරාගැනීමේ ක්‍රමවේදය ප්‍රසිද්ධ කර ඇති බව | 3.11 | | |
| 17 | ලංසු ලියවිලි පිළිබදව ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව එකගවී ඇති බව | 2.5.1 (ඇ) | | |
| 18 | ලංසු ලියවිලි පිළිබද ප්‍රසම්පාදන කමිටු තීරණයට හා ලංසු ආරාධනය ප්‍රසිද්ධ කිරීම සදහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බව (අවශ්‍ය නම් පමණි) | | | |
| 19 | ලංසු ලියවිලි ප්‍රසිද්ධ කිරීම නියමිත පරිදි සිදුකර ඇති බව | 3.1.4, 3.2.2 | | |
| 20 | ලංසු කැදවීමේ ලේඛන නියමිත පරිදි නිකුත්කර ඇති බව | 6.1 | | |
| 21 | පූර්ව ලංසු රැස්වීම පවත්වා ඇති බව | 5.3.14 (ඇ) | | |
| 22 | පූර්ව ලංසු රැස්වීමේ කරනලද පැහැදිලි කිරීම් සහිත රැස්වීම් වාර්තාව නිකුත්කර ඇති බව | 5.3.14 (අ) (ආ) | | |
| 23 | පූර්ව ලංසු රැස්වීමේ වාර්තාව ලංසු ලියවිලි මිලදී ගන්නා ලද සෑම විභව ලංසු කරුවකු වෙත ම යවා ඇති බව | 5.3.14 (ඇ) | | |
| 24 | පූර්ව ලංසු රැස්වීමේදී ඉදිරිපත් වූ විභව ලංසුකරුවන්ගේ සෑම ඉල්ලීමක් සදහාම ප්‍රතිචාර දක්වා ඇති බව | 5.3.15 | | |
| 25 | ලංසු ඉදිරිපත් කිරීමේ කාලය අවසන් වීමට පෙර ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් නිර්දේශිත පරිදි ක්‍රියා කර ඇති බව | 6.1.1 | | |
| 26 | ලංසු භාර ගැනීම නිසි පරිදි සිදුකර ඇති බව | 6.3 | | |
| 27 | ප්‍රමාදවී ලැබුණු ලංසු ප්‍රතික්ෂේප කර ඇති බව | 6.3.2 | | |
| 28 | ප්‍රමාදවී ලැබුණු ලංසු විවෘත නොකර ආපසු යවා ඇති බව | 6.3.2 | | |
| 29 | ලංසු භාර ගැනීම අවසන් කිරීම නිසි පරිදි සිදුකර ඇති බව | 6.3.3 (ඇ) | | |
| 30 | ලංසු විවෘත කිරීමේ කමිටුව විධිමත්ව පත්කර ඇති බව | 6.3.3 (අ) | | |
| 31 | ලංසු විවෘත කිරීම නියමිත ස්ථානයේදී නියමිත වේලාවට සිදුකර ඇති බව (තාක්ෂණික යෝජනා අඩංගු කවර පමණි) | 6.3.3 (ආ) | | |
| 32 | ඉල්ලා අස් කරගන්නා ලද ලංසු සම්බන්ධයෙන් උපදෙස් අනුව කටයුතු කර ඇති බව | 6.3.3. 6.3.4 | | |
| 33 | ලංසු විවෘත කිරීමේ වාර්තාව නියමිත ආකෘති පත්‍රයේ සම්පූර්ණ කර ඇති බව | 6.3.6 | | |
| 34 | ලංසු විවෘත කිරීමේ රැස්වීමට පැමිණි ලංසු කරුවන්ගේ හා ඔවුන්ගේ නියෝජිතයින්ගේ පැමිණීම නිසි පරිදි සටහන් කරගෙන ඇති බව | 6.3.6 | | |
| 35 | විවෘත කරන ලද ලංසු (තාක්ෂණික යෝජනා) ලංසු විවෘත කිරීමේ වාර්තාව සමග ඇගයීම සදහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත විධිමත්ව භාර දී ඇති බව | 6.3.7 | | |
| 36 | ප්‍රාරම්භක ලංසු පරීක්ෂාව නිසි පරිදි සිදුකර ඇති බව | 7.8 | | |
| 37 | ප්‍රාරම්භක ලංසු පරීක්ෂාව සදහා නිර්දේශිත ආකෘතිය භාවිතා කර ඇති බව | 7.11.1 | | |
| 38 | ලංසු භාර ගැනීම අවසන් වූ පසු එහෙත් ඇගයීම් අවසන් කිරීමට පෙර ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් නිර්දේශිත පරිදි ක්‍රියාකර ඇති බව | 6.1.1 | | |

| | | | | |
|---|---|---|---|---|
| 39 | විස්තරාත්මක ලංසු ඇගයීම විධිමත්ව සිදුකර ඇති බව | 7.8 | | |
| 40 | තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලත් ලංසුකරුවන් තෝරාගෙන ලැයිස්තුගත කර ඇති බව | 3.11 | | |
| 41 | තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලත් ලංසුකරුවන් පිලිබද තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර මූල්‍ය ලංසු විවෘත කිරීමට අනුමැතිය ලබාගෙන ඇති බව | 3.11 | | |
| 42 | ලංසු සුරක්ෂණ වල වලංගු කාලය දීර්ඝ කිරීමක් අවශ්‍ය වන්නේ නම් එය නිසි පරිදි සිදුකර ඇති බව | | | |
| 43 | තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලත් ලංසුකරුවන්ගේ මූල්‍ය ලංසු ප්‍රසිද්ධියේ විවෘත කර ඇති බව | 3.11.1.(ඇ) | | |
| 44 | මූල්‍ය ලංසු විවෘත කිරීමේ වාර්තාව නියමිත ආකෘති පත්‍රයේ සම්පූර්ණ කර ඇති බව | 6.3.6 | | |
| 45 | මූල්‍ය ලංසු විවෘත කිරීමේ රැස්වීමට පැමිණි ලංසු කරුවන්ගේ හා ඔවුනගේ නියෝජිතයින්ගේ පැමිණීම නිසි පරිදි සටහන් කරගෙන ඇති බව | 3.11 | | |
| 46 | මූල්‍ය ලංසු සඳහා වන ප්‍රාරම්භක ලංසු පරීක්ෂාව නිසි පරිදි සිදුකර ඇති බව | 3.11 , 7.8 | | |
| 47 | ප්‍රාරම්භක ලංසු පරීක්ෂාව (මූල්‍ය ලංසුව) සඳහා නිර්දේශිත ආකෘතිය භාවිතා කර ඇති බව | 7.11.1 | | |
| 48 | මූල්‍ය ලංසු සඳහා වන විස්තරාත්මක ලංසු පරීක්ෂාව නිසි පරිදි සිදුකර ඇති බව | 3.11 , 7.9 | | |
| 49 | මූල්‍ය ලංසු සඳහා වන විස්තරාත්මක ලංසු පරීක්ෂාව සඳහා නිර්දේශිත ආකෘතීන් භාවිතා කර ඇති බව | 7.11.1 | | |
| 50 | තෝරාගන්නා ලද ලංසුකරුගේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂාව සිදු කර ඇති බව | 7.10 | | |
| 51 | ලංසු මිල අඩු කරගැනීම සඳහා සාකච්ඡා කිරීම කර ඇති බව (ඉඩ දී ඇත්නම් පමණි) | 7.12.4 | | |
| 52 | තාක්ෂණික ඇගයීම් කමිටු අවසන් වාර්තාව නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් කර ඇති බව | 7.11.1 | | |
| 53 | ප්‍රසම්පාදන කමිටු අවසන් වාර්තාව නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් කර ඇති බව | 8.1 | | |
| 54 | ජයග්‍රාහී ලංසුකරු වෙත කොන්ත්‍රාතුව පිරිනැමීමේ අදහස පිළිබඳව සියළුම ලංසුකරුවන් වෙත නියමිත කාලය තුල දන්වා යවා ඇති බව | 8.2 | | |
| 55 | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට එරෙහිව නියෝජන ඇත්නම් අභියාචනා කරන ලෙස අසාර්ථක ලංසුකරුවන් වෙත ලිඛිතව දන්වා යවා ඇති බව | 8.3 | | |
| 56 | අභියාචනා මණ්ඩලයේ නිර්දේශ අනුව කටයුතු කරඇති බව (අදාල වන්නේනම් පමණි) | 8.4 | | |
| 57 | ප්‍රසම්පාදන කමිටු තීරණය අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බව (අදාල වන්නේනම් පමණි) | 8.7.1 | | |
| 58 | ප්‍රසම්පාදන කමිටු තීරණය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව (අදාල වන්නේනම් පමණි) | 8.7.1 , 4.2.3 | | |

| | | | | |
|---|---|---|---|---|
| 59 | කොන්ත්‍රාත්තුව පිරිනැමීම හෙවත් තෝරාගත් සැපයුම්කරු වෙත ඒ බව දන්වා යැවීම (විධිමත් ප්‍රතිග්‍රහන ලිපිය නිකුත් කර ඇති බව) | 8.7.1.(ආ)<br>8.9.1 | | |
| 60 | කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රසිද්ධියට පත් කිරීම සිදුකර ඇති බව | 8.10 | | |
| 61 | අසාර්ථක වූ ලංසුකරුවන්ගේ අඩුලුහුඩුකම් සංක්ෂිප්ත දැක්වීම සිදුකර ඇති බව | 8.8 | | |
| 62 | ගිවිසුම් අත්සන් කිරීම සිදුකර ඇති බව (අදාල නම් පමණි) | 8.9.1, 8.9.3 | | |
| 63 | කාර්යසාධන සුරක්ෂණය ලබාගෙන ඇති බව හා එහි වලංගු භාවය පරීක්ෂා කර ඇති බව (අදාල නම් පමණි) | 5.4.10, 8.7.1 | | |
| 64 | කොන්ත්‍රාත් ගිවිසුමේ පිටපතක් විගණකාධිපති වෙත යවා ඇති බව (අදාල නම් පමණි) | - | | |
| 65 | නියමිත පරිදි ලංසු සුරක්ෂණ නිදහස් කර ඇති බව | 5.3.13 | | |
| 66 | අත්තිකාරම් ගෙවීම් සිදුකර ඇති බව (අදාල වන්නේනම් පමණි) | 5.4.5 | | |
| 67 | අත්තිකාරම් සුරක්ෂණය ලබාගෙන ඇති බව (අත්තිකාරම් ගෙවන්නේනම් පමණි) | 5.4.5 | | |
| 68 | ගිවිසුම් ප්‍රකාරව භාණ්ඩ ලැබී ඇති බව (As per agreed delivery schedule ) | - | | |
| 69 | ලැබුණු භාණ්ඩ ඇනවුම් කළ භාණ්ඩ වල තාක්ෂණික පිරිවිතර වලට අනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් හෝ වෙනත් සුදුසුකම් ලත් අයකු විසින් පරීක්ෂාවක් කර ඇති බව | - | | |
| 70 | වගකීම් සහතික (Warranty) පරීක්ෂා කර භාරගෙන ඇති බව (අදාල වන්නේනම් පමණි) | - | | |
| 71 | සැපයුම්කරුට මුදල් ගෙවීම නියමිත පරිදි සිදුකර ඇති බව | - | | |
| 72 | රඳවුම් මුදල් තබාගැනීම සිදුකර ඇති බව (අදාල වන්නේනම් පමණි) | 5.4.10 (ඈ) | | |
| 73 | එකතුකළ අගය මත බදු (VAT) ගෙවීම නියමිත පරිදි සිදුකර ඇති බව | 5.4.11 | | |
| 74 | සැපයුම්කරු විසින් නියමිත කාලය තුළ භාණ්ඩ සැපයීමට අපොහොසත් වී ඇත්නම් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකරගෙන ඇති බව | 5.4.13 | | |
| 75 | තෝරාගත් සැපයුම්කරු විසින් කොන්ත්‍රාත්තුව භාර නොගන්නා ලද්දේ නම් ලංසු සුරක්ෂණය මුදල් කරගෙන ඇති බව | 5.3.13 | | |
| 76 | සැපයුම්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව භාණ්ඩ සැපයීමට අපොහොසත් වී ඇත්නම් කාර්යසාධන සුරක්ෂණය මුදල් කරගෙන ඇති බව (ඇත්නම් පමණි) | 5.4.10 | | |
| 77 | පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ දත්ත මූලාශ්‍රය යාවත්කාලීන කර ඇති බව | 8.11 | | |
| 78 | ප්‍රසම්පාදනයේ සියළු කටයුතු ප්‍රසම්පාදන කාල රාමුවට අනුව සිදුකර ඇති බව | 4.2.3 | | |

..................................... ......................................

විගණක දිනය